# රූපවාහිනී නාලිකා මාධ්‍ය උපමාන උල්ලංඝනය කරනවා

## - පැෆරල් සංවිධානය

රූපවාහිනී නාලිකා ඉතා නිර්ලජ්ජිත ලෙස මාධ්‍ය උපමාන උල්ලංඝනය කරමින් සිටින බවට නිරීක්ෂණය වන බව පැෆරල් සංවිධානය සඳහන් කරයි. මැතිවරණ කොමිෂන් සභාව විසින් ගැසට් නිවේදනයක් මගින් සියලුම මාධ්‍ය ආයතන ජනාධිපතිවරණයේදී හැසිරිය යුතු ආකාරය දක්වා ඇති නමුත් මෙම තත්ත්වය නිරීක්ෂණය කිරීමට සහ ක්‍රියාමාර්ග ගැනීමට යම් ක්‍රමවේදයක් සැකසිය යුතු බවට පැෆරල් සංවිධානය විදුලි සංදේශන නියාමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට ලිපියක් යවා ඇත.

මහජන දේපළක් වන විද්‍යුත් සංඛ්‍යාත භාවිත කිරීමට පෞද්ගලික සහ රාජ්‍ය අංශයට ලබාදීමේදී එම ආයතන සාධාරණ උපමානයන්ට අනුකූලව භාවිත කරනවාදැයි සොයා බලා කටයුතු කිරීමේ බලපතළ වගකීමක් විදුලි සංදේශන නියාමන කොමිෂන් සභාවට තිබෙන බව එම ලිපිය මගින් දක්වා ඇත.